දුරකථන / தொலைபேசி / Telephones } 011-2136600 / 011-2136650
ලේකම් / செயலாளர் / Secretary } 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2876169 / 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail } info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website } www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය / எனது இல. / My No. } PSC/APL/04/AT/SLAS/2025

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2026.06.5

ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**<u>2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම</u>**
**<u>ශ්‍රී ලංකා පරිපාලන සේවය</u>**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සම්බන්ධයෙන් ඔබ විසින් අනුමත කරන ලද 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනාවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ මේ සමඟ ඔබ වෙත එවමි.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති මෙම අභියාචනා අතරින් ක්‍රියාත්මක විය යුතු දිනය සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් කර නොමැති සියලු ස්ථාන මාරු **<u>2026.06.16</u>** දින සිට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි. ඒ අනුව, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්ගේ 2026 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කරන ලෙසත්, වාර්ෂික ස්ථාන මාරුවීම් ලද නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි. ස්ථාන මාරු ක්‍රියාත්මක වීම සඳහා වෙනත් නිශ්චිත දිනයක් ලබා දී ඇති ස්ථාන මාරුවීම් ද එම දින සිට අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක විය යුතු වේ.

03. එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා එවීමට කටයුතු කරනු නොලැබේ. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2(ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේ ය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බව ද කාරුණිකව දැනුම් දෙමි.

05. 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියලුම නිලධාරීන් නියමිත දිනයේ නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථානවලින් මුදා හැරීමට කටයුතු කිරීම සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ හා ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේ ද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙස ද ඔබ වෙත දන්වා සිටිමි.

06. වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257(v) වගන්තිය අනුව, සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා තනතුර අතහැරයාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේ ද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු වේ.

07. තවද, 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීමේ දී අමාත්‍යාංශ වෙනස්වීම් හේතුවෙන් යම් නිලධරයකු ස්ථාන මාරු විය යුතු සේවා ස්ථානය පිළිබඳව ගැටළු සහගත තත්වයක් පවතින අවස්ථාවක දී, අදාල නිලධාරියාගේ අනුප්‍රාප්තිකයා වශයෙන් සලකනු ලබන නිලධරයා සේවයේ යෙදී සිටින ස්ථානය ඔහුගේ/ඇයගේ නව සේවා ස්ථානය විය යුතු බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

08. එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති ස්ථාන මාරු සම්බන්ධව ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සලකා නොබලන බව දන්වන අතර එවැනි ඉල්ලීම් හා නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

Mday

**ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

23

## ශ්‍රී ලංකා පරිපාලන සේවයේ වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ අභියාචනා -2026 සම්බන්ධ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ

| අනු අංකය | මුලකුරු සමග නම | වර්තමාන ශ්‍රේණිය | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලද පාසල/ සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|---|
| 1 | අයි.ඩබ්.පී.සේනාරත්න මහත්මිය | ශ්‍රී.ලං.ප.සේ.I | පරිසර අමාත්‍යාංශය | මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | I අභියාචනයට ඉඩදෙමින් ස්ථාන මාරුව අවලංගු කිරීම<br>II අනුප්‍රාප්තික නිලධාරියා වන එම්.ජ්.රණවක මහත්මියගේ ස්ථාන මාරු වන සේවා ස්ථානය මුදල් ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ලෙස සංශෝධනය කිරීම<br>III චක්‍රයේ අනෙකුත් නිලධාරින්ගේ ස්ථාන මාරු එලෙසම ක්‍රියාත්මක කිරීම |
| 2 | එල්.වී.හෙට්ටිආරච්චි මහතා | ශ්‍රී.ලං.ප.සේ.I | බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (ස්වදේශ කටයුතු අංශය) | අභියාචනයට ඉඩදෙමින් ස්ථාන මාරුව අවලංගු කිරීම |
| 3 | ඩබ්.ජ්.වයි.එස්.පී.වීරසිංහ මහත්මිය | ශ්‍රී.ලං.ප.සේ.I | රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (ස්වදේශ කටයුතු අංශය) | බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | PSC/APP/05/02/19/2023 හා 2026.01.15 දිනැති ලිපිය මඟින් නිලධාරිනියගේ ස්ථාන මාරුව අවලංගු කර ඇත. |

24/01/2026

9/23

## ශ්‍රී ලංකා පරිපාලන සේවයේ වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ අභියාචනා -2026 සම්බන්ධ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ

| අනු අංකය | මුලකුරු සමග නම | වර්තමාන ශ්‍රේණිය | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලද පාසල/ සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|---|
| 4 | ජේ.ඒ.අයි.ඒ.පෙරේරා මහත්මිය | ශ්‍රී.ලං.ප.සේ.I | වෙළඳ වාණිජ ආහාර සුරක්ෂිතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය | ස්ථාන මාරු ලැබී නොමැත. | PSC/PRO/07/2271/2025 හා2026.01.20 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා රේගුවෙහි පුරප්පාඩුව පැවති ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ තනතුරක් වෙත නිලධාරිනිය ස්ථාන මාරු කිරීමට අනුමැතිය දී ඇත. |
| 5 | පී. කිරියා මහත්මිය | ශ්‍රී.ලං.ප.සේ.II | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පුනකරි | ස්ථාන මාරු ලැබී නොමැත. | රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/6053 හා 2025.12.29 දිනැති ලිපිය මගින් නිලධාරිනිය උතුරු පළාත් සභාව වෙත ස්ථාන මාරු කර ඇත. |

NKS

29/01/2026